(2007 ජන. 12, පෙ.ව. 10.15)
(දියසේනගේ දේශපාලන විචාරය)

මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපති ලෙස අභිනවයෙන් දිව්රුම් දෙමින් ශ්‍රී ලාංකිකයින්ට පවසා සිටියේ ශ්‍රී ලංකාව තුළ සාමය, නීතිය බලය, මානව හිමිකම් හා ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන බවයි. එතුමන්ගේ එකී අභිප්‍රායේ අංක එකේ මූලෝපාය ලෙස අද වන විට පෙන්නුම් කරන්නේ , උතුරු නැගෙනහිර ප්‍රදේශවල ක්‍රියාත්මක වන ත්‍රස්තවාදය පරාජයට පත් කිරිමේ මිලිටරි මෙහෙයුමයි. මේ වන විට ජීවතුන් අතර නැති ආචාර්ය නිව්ටන් ගුණසිංහයන් වරෙක පවසා තිබුණේ ලංකාවේ 'ජනවාර්ගික ප්‍රශ්නය', මේ සමාජය තුළ අප මුහුණ දෙමින් සිටින සියලු ප්‍රශ්න අධිනිශ්චය කර ඇති බවයි. නමුත් මේ වන විට සිදුවෙමින් පවතින දෑ විමසන විට පෙනී යන්නේ වර්තමාන ජනාධිපති සහ රජය විසින් අප රටේ සියලුම ක්‍රියාකාරකම්, එම රජයේ දේශපාලන මූලෝපාය ලෙස පෙන්නුම් කරමින් සිටින ඉහත කී මිලිටරි ක්‍රියාදාමය මගින් අධිනිශ්චයව කරවීමට කටයුතු කරමින් සිටින බවය.

ජනතාවගේ අදහස් ප්‍රකාශ කිරීම් අයිතියේ සිට වෘත්තිය ක්‍රියාමාර්ග දක්වා වූ සියලුම දෑ මෙම දේශපාලන ක්‍රියා මාර්ගයට හොඳින් හෝ නරකින් යටත් කිරීමට වර්තමාන රජය පෙළඹී තිබේ. මෑතකදී එක්සත් ජනතා ව්‍යාපාරය විසින් පවත්වන්නට යෙදුන ප්‍රචාරක රැළියට එල්ල කළ මැර ප්‍රහාරය මගින් ද, සමස්ත ලංකා ප්‍රවාහන සේවක වෘත්තිය සමිතිය මගින් සංවිධානය කළ වෘත්තිය ක්‍රියාමර්ගය බලය යොදා විසුරුවා හැරීමෙන්ද පෙනී යන්නේ මෙකී කටුක සත්‍යයි.

ඒ හැරුනු කොට මේ වන විට ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ද සාර්ථක ලෙස ස්වයං වාරණයකට ලක් කරවීමට ජනාධිපතිතුමන්ගේ දේශපාලනයට හැකිවී තිබේ. ඒ තුළින් සිදුවෙමින් පවතින්නේ ද ඉහත කී ක්‍රියාදාමයයි. ඒ සඳහා අනුගමනය කරන්නාවූ බහු විධ ක්‍රියාමාර්ග අතරින් එක් සිත් ගන්නා සුළු ජනප්‍රියවාදී දේශපාලන අලෙවි ක්‍රියාමාර්ගයක් පිළිබඳව යම් ආකාරයක විශ්ලේශනයක යෙදීම මෙම ලිපියේ අරමුණ වී තිබේ. ඒ අන් කිසිවක් නොව මහින්ද රාජපක්ෂ රජයේ මිලිටරි දේශපාලනය පොදු ජනතාව අතර අලවිකරනයට යොදා ගෙන ඇති 'අපි වෙනුවෙන් අපි' නමැති තේමා පාඨය යටතේ ඉදිරිපත් වන ලයාන්විත ගීතයයි. සැබැවින්ම නිර්මාණාත්මක හා සිත්ගන්නා සුළු ලෙස ඉදිරිපත් කරන එම ගීතය මගින්, අප රටේ බහුතරයක් මෙරට තුළ ක්‍රමයෙන් පොදු වෙමින් පවතින මහා පරිමාණ යුද්ධයට ප්‍රේම කරන්නට පුරුදු පුහුණු කරමින් සිටී. මිලිටරි විද්‍යාවට අනුව මෙය වැදගත් මූලෝපායකි. යුද්ධයකදී, එය මෙහෙයවන බලවේගයන්ට තමන් යැපෙන සමාජයේ සහාය අත්‍යාවශ්‍යය. ඒ අර්ථයෙන්ම ගත් කළ මෙකී ගීතයට

දේශපාලනික අරමුණක් තිබේ. රජයේ පැත්තෙන් ගත් කළ මෙකී උත්සාය නිවැරදිය. නමුත් ප්‍රශ්නය ආරම්භවන්නේ මෙම ගීතයේ සඳහන් 'අපි' යන්න විශ්ලේෂණය කරන්නට ගත් කළය. අපි යන්නෙහි පොදු ගුණාකාරයක් සොයා යාමට තැත් කළ කල්හිය.

මෙය තේරුම් ගැනීම අද දවසේ දේශපාලනයයි. සරලව බැලූ කළ 'අපි' යනුවෙන් හඳුන්වන සියලු දෙනා යුද්ධයට විරුද්ධය. නමුත් ඒ සියලු දෙනා අතරින් තමන් විරුද්ධවන යුද්ධයට තිත තබන්නට උත්සාහ කරන්නේ දෙආකාරයකට ය. එක් කොටසක් මෙරට සිවිල් යුද්ධයේ එක් පාර්ශවයක් සම්පූර්ණයෙන් පරාජය කොට යුද්ධය නැවැත්වීමට ප්‍රාර්ථනා කරන කල්හි, අනෙක් කොටස දෙපාර්ශවයටම පිළිගත හැකි දේශාපාලන විසඳුමක් සඳහා සාකච්ඡා මාර්ගය තුළින් යුද්ධය නතර කරගැනීම ප්‍රඥාගෝචර බව විශ්වාස කරති. මේ පිළිබඳ ජනමතයේ සංඛ්‍යාත්මක භාවය විමසන්නේ නම්, ඒ සඳහා අපට හමුවන ආසන්නතම ජනමතය වන්නේ, මීට වසරකට පෙර පැවති ජනාධිපති වරණයයි. එහිදී 48 ලක්ෂයක් වූ ජනතාව සෘජුව හෝ වක්‍රව යුද්ධය සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගැනීම සුදුසු බව ප්‍රකාශ කොට තිබුණේ යයි තර්ක කළ හැකිය. ඒ අර්ථයෙන් ගත් කළ මෙරට වෙසෙන දෙමළ ජනතාව හැර අනෙක් සියලු ජනතාව තම දේශපාලනික අභිමථාර්ත අනුව අඩු වැඩි වශයෙන් දෙකට බෙදී සිටිති. ඒ අනුව මේ රටේ 'අපි' පළමු විශ්ලේෂනය තුලදීම කොටස් දෙකකට බෙදී සිටිති. නමුත් වර්ථමානයේ පුන පුනා උත්සාහ දරන්නේ මෙරටෙහි 'අපි ' අඛණ්ඩ නොබෙදුනු ජනමතයක් වන බවය. තවමත් මහා පරිමාන යුද්ධයක් අප වෙත ලඟාවී නොමැත. යුද්ධමය තත්ත්වයක් රට තුළ පැවතුන ද, එය වර්ෂ 2000 දී පැවති ආර්ථික, සමාජීය හා සංස්කෘතික සංදර්භය වෙත තවමත් අප සමාජය එලෙසම ලඟාවී නොමැත. නමුත් අප සමාජය ගමන් කරමින් සිටිනනේ එවන්වූ තත්ත්වයක් වෙතය. යම් හෙයකින් එවන් තත්ත්වයක් ඇති වුවහොත් මෙලෙස 'අපි' ලෙස හඳුන්වා ගන්නාවූ 'අපි' කුමන ආකාරයකට එවැනි තත්ත්වයක් වෙත ප්‍රතික්‍රියා දක්වනු ඇත්ද යන්න තේරුම් ගැනීම අනාගත දේශපාලනය පිළිබඳව අදහසක් ඇති කර ගැනීමට ප්‍රබල උපකාරයක් සපයයි. මේ පිළිබඳව තේරුම් ගැනීමට ලෝක උදාහරණ ද තිබේ. සැප්තැම්බර් 11 දාට පසුව බුෂ් දේශපාලනය ඇති කළ දේශප්‍රේමය, ඇෆ්ගනිස්තානය හරහා මෝදුවී, ඉරාකයේදී උච්චතම ස්ථානයට පැමිණයේ ය. මේ සෑම අවස්ථාවකදීම රිපබ්ලිකන්වරුන් උත්සාය කළේ, ඇමරිකානුවන්ගේ උගුර හරහා දේශප්‍රේමය බලෙන් එබ්බවීමයි. ඒ සඳහා ජනමාධ්‍ය හා ජනසන්නිවේදනය ද හදිසි තත්ත්වයක් හරහා හදිසි නීතිය ද උපරිම ලෙස භාවිතා කළේය. ඒ නිසාම බුෂ් හිටියේ දේශපාලනික ගිනි පෙත්තේය. නමුත් අද වන විට ඔහුට අත්වී ඇති දේශපාලනික ඉරණම බෙද ජනකය. ලංකාවේ දේශපාලනඥයින්ට මෙවැනි උදාහරණ මගින්

උගත හැකි දෑ බොහෝය. ඒ නිසාම ලංකාවේ අද ක්‍රියාත්මක දේශප්‍රේමයේ දිග පලල තේරුම් ගැනීම, අනාගත දේශපාලන ප්‍රක්ෂේපනයක් සඳහා බෙහෙවින් ප්‍රයෝජනවත් වනු නිසැකය.

වර්තමානයේ දිග හැරෙමින් පවතින මහා පරිමාණ යුද්ධය පවත්වා ගැනීමට අවශ්‍ය වන්නාවූ මිනිස් බල අවශ්‍යතා යුද්ධයේ ආර්ථික වියදම හේතුවෙන් ඇති විය හැකි ආර්ථික අවපාතයන්, මානව හිමිකම් උල්ලංඝනයන් හේතු කොට ගෙන, ඇති විය හැකි ජාත්‍යන්තර පීඩනය, මේ රටේ දේශමාමකත්වය උරගා බැලිය හැකි තියුණු සන්ධිස්ථානයන්ය. එවැනි අවස්ථාවකදී අපරටේ ජනතාව නිසි සංයමයකින්, තම දූ පුතුන් යුද්ධයට යවා, පටි තද කොටගෙන, ඇති හැකි අය, ආසියානු ආර්ථික අර්බුදයේදී දකුණු කොරියානුවන් තායි ජාතිකයින් ක්‍රියා කළාක් මෙන්, තම මුදල් රන් ආභරණ රටේ භාණ්ඩාරයට පරිත්‍යාග කරන ක්‍රියාකාරීත්වයක් පවත්වා ගෙන ගිය හොත්, ගීතයේ නියමිත අර්ථයෙන් 'අපි' වෙනුවෙන් 'අපි' ක්‍රියා කරන බවට අපට උදම් ඇනිය හැකි වනු ඇත.

කෙසේ නමුත් දන් ඇතැම් ක්ෂේත්‍ර තුලදී මෙලෙස 'අපි' වෙනුවෙන් අපටම දැක්විය යුතු දේශපාලන සංවේදී භාවය, එකී සටන් පාඨය හඳුන්වාදෙන බලවේගයන් තුළින්ම ගිලිහී යන බවක් පෙන්නුම් කරමින් සිටී. එහි පලමු වෙඩි මුරය වතුකරයේදී වතුකර ජනතාව මෙහෙයවන වෘත්තීය සමිති මගින් පත්තු කළේය. ප්‍රශ්නයේ සාධාරණත්වය කෙසේ වෙතත්, තම මූලික දේශපාලනයට එකී ක්‍රියාව පරස්පර වූයේය. ඒ නිසාම යුද්ධය මෙහෙයවන රජයට මිලියන ගණනක ආදායම අහිමිවී ගියේය. මේ වන විට උපාධිධාරීන්ද වෘත්තිය ක්‍රියා මාර්ගයකට අවතීර්ණ වී සිටිති. ප්‍රවාහන සේවයේ, ලංගම සේවකයන්ද අද වීදි බැස තිබේ. මේ සියලු ඉල්ලීම් දිනාගැනීම යනු භාණ්ඩාගාරයෙන් යුද්ධයට වැය කළ යුතු පිරිවැයෙන් කොටසක් මෙකී වෘත්තීය ඉල්ලීම් සඳහා වැය කිරීම බව මේ පිරිසට දේශපාලනිකව අමතක වී ඇති සෙයකි. මේ සියල්ලෝම රාජපකෂ ජනාධිපතිවරයා බලයට පත් කරන්නට දර දිය ඇද්දවුන්ය. එහෙයින් රාජපක්ෂ රජයේ මිලිටරි දේශපාලන ව්‍යාපෘතියට හදවතින්ම සහයෝගය ලබාදුන්නේ මොවුන්ය. නමුත් එකී රජයේ 'අපි වෙනුවෙන් අපි ' සටන් පාඨයට තල්ලුවක් දෙමින්ම, ඔවුන් තමන්ගේ අපේ කම, තම තමන්ගේ පෞද්ගලිකවූ දේශපාලන, ආර්ථික න්‍යාය පත්‍ර මගින් කඩතොලු කරමින් සිටිති. මෙකී පරස්පරය හඳුනාගැනීම අද දවසේ වැදගත්ම අවශ්‍යතාව බවට පත්වන්නේ අනාගත ස්ථාවර සාමකාමී ශ්‍රී ලංකාවක් බිහි කිරීමේ අධිටන තුළ ක්‍රියාකරන්නවුන්ට ය.

ශ්‍රී ලංකාවේ පවතින අභ්‍යන්තර සිවිල් යුද්ධය, මිලිටරි ක්‍රියාදාමයක්

මගින් අවසාන කිරීමට උත්සාහ දරණ පළමු ශ්‍රී ලාංකික රජය හෝ අවසාන ශ්‍රී ලාංකික රජය බවට මේ රජය පත් නොවේ. 1979 දී ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා, තම බෑනනුවකු වූ බ්‍රිගේඩියර් වීරතුංග යාපනයට යවන ලද්දේ පැය 48 තුළ බෙදුම්වාදය මර්ධනය කිරීමටය. ප්‍රේමදාස ජනාධිපතිවරයා, මේජර් ජෙනරාල් ලකී අල්ගම මෙහෙයවමින් නැගෙනහිර පලාතේ භූමිය පූර්ණ වශයෙන් ශ්‍රීලංකා රජයේ පාලනයට නතු කරගත්තා පමණක් නොව සාර්ථක ලෙස පළාත් පාලන ඡන්දයක් ද පැවැත්වූයේ ය. ඉන් පසු චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිනිය, ජනරාල් රත්වත්තේ මෙහෙයවමින් බෙදුම්වාදීන්ගේ කිරුළ ලෙස හැඳින්වූ යාපනය අර්ධද්වීපය සිය පාලනයට යටත් කරගත්තේය. නමුත් මෙකී ජයග්‍රහණ සැමකින් අත්වූයේ භූමිය පමණි. බෙදුම්වාදයට ඔක්සිජන් සපයන දේශපානික හේතූන් පරාජය කිරීමට මෙකී එකදු හෝ ජයග්‍රහනයකට හැකිවූ බවක් ඉතිහාසය අපට පෙන්වා දෙන්නේ නැත. එයින් ඇතිවූ එකම ප්‍රතිපලය වූයේ දහස් ගණනකගේ ජීවිත අහිමි වී ලක්‍ෂ ගණනක් අවතැන්වීම හා ආර්ථිකය වලපල්ලට යෑම පමණකි. කෙසේ නමුත් මේ සියලු සිදුවීම් හරහා, පරාජයට පත්වූ මූලික තත්ත්වය වූයේ, මෙරටේ ප්‍රජාතන්ත්‍රවාදය හා මානව ගෞරවයෙන් යුතුව සුරක්‍ෂිතව සාමාජයක් තුළ ජීවත්වීමට ජනතාවට ඇති මූලික අයිතිවාසිකමයි. අද සිදුවෙමින් පවතිනනේද එවනැන්කි. මංගල සමරවීර මහතා මෑතකදී පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කොට තිබුණේ පසුගිය වසර තුළ ආසන්න වශයෙන් 4000 කට අධික ශ්‍රී ලාංකිකයන් පිරිසක් මිය ගොස් ඇති බවය. පවුල් 60,000 කට ආසන්න ප්‍රමාණයක් අවතැන්ව අනාථව ඇති බවය. මියගිය 4000 න් අඩක් සිවිල් වැසියන් වේ.

තත්ත්වය මෙසේ වූවත් මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳව සංවේගයත් පොදු වශයෙන් ගොඩනගා ගැනීමට අද අප සමාජයට නොහැකිවී තිබේ. මරණය හෝ අතුරුදහන්වීම් පිළිබඳව අප සංවේගවන්නේ අපේ කම යන නිර්නායකය තුළය. ඒ නිසා අපේ සමාජය මේ වන විට තිරස්ව හා සිරස්ව බෙදී සිටිති. තත්ත්වය බරපතල වන්නේ මෙවන් සංවේදී භාවයන් විසින් සමාජය තුළ ඇති කළ යුතු වන්නා වූ ජන මාධ්‍යයෙහි ක්‍රියාකාරීත්වය සලකා බලන කලය. අද මෙරටේ ජන මාධ්‍ය එක්කෝ ස්වයං වාරණයට පත්ව සිටිති. නැති නම් වාරණයක අනතුර නිසා නිහඬව සිටිති. මෙවර මානව හිමිකම් පිළිබඳව සංවේගයක් සමාජය තුළ ජනිත කෙරන පුවතක් හෝ ජනමාධ්‍ය තුළ පළවන්නේ නම් එය කලාතුරකින් සිදුවන්නකි. දැනට මාධ්‍ය තුළ සිදුවන්නේ මරාගැනීම හා මරාදැමීම පිළිබඳව 'අපි' ලෙස හඳුන්වනු ලබන්නාවූ ජනතාව තුළ ආශ්වදායක් ඇති කිරීමයි. මේ තත්ත්වය නිසාම, ලෝක ප්‍රජාව තුළ අප වගකීමකින් යුතුව ක්‍රියාත්මක වන ජන සමාජයක් ය යන හැඟීම අපගේ ආවේගකාරී

අන්ධභාවය විසින් ක්‍රමානුකූලව නැති කරමින් සිටී. මේ වන විට අප ගමන් කරමින් සිටින්නේ මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ චිර ප්‍රසිද්ධියට පත් රුවන්ඩාව,සෝමාලියාව වැනි දුර්භාග්‍ය සම්පන්න රටවල් කණ්ඩායමක් තුළ ප්‍රධානත්වයට පත්වීමටය. ජනවාරි 15 වැනිදා ඉතිහාසයේ ප්‍රථම වරට ආරක්ෂක මණ්ඩලයේ සාකච්ඡාවට ශ්‍රී ලංකාවේ තත්ත්වය බඳුන් වේ. ඉන් පසුව යුරෝපා සංගමයේ බලපෑමට අප ලක්වනු නිසැකය. ශ්‍රී ලංකාවට හිතවාදී පිළිවතක් අනුගමනය කළ ඉන්දියාව මේ වන විට අපෙන් වියෝවෙමින් සිටී. මෙකී තත්ත්වය වෙනසකින් තොරව ඉදිරියට ඇදුනහොත් 2007 වර්ෂය නිදහසින් පසු ඇතිවූ අඳුරුතම වර්ෂය වන්නට ඉඩ තිබේ. බෙදුම්වාදී දේශපාලනයට අවශ්‍ය තිබුණේද මෙයයි. කදිර්ගාමර් මහතා විසින් පලමුව ද, රනිල් වික්‍රමසිංහ මහතා විසින් දෙවනුව ද ඇති කළ ජාත්‍යන්තර දැල දූන් ක්‍රමයෙන් ලිහෙමින් පවතී.

මෙකී තත්ත්වය වලක්වා ගැනීමට ඇති එකම හැකියාව වන්නේ, ‘අපි වෙනුවෙන් අපි’ එකිනෙකාට සංවේදීවීමයි. වාර්ගික ආවේගයන්ට හෝ දේශපාලනික ආවේගයන්ට යටත්ව අනුභූතික යථාර්තයන් විශ්ලේෂනය හා තේරුම් ගැනීම පසෙකට දමා යථාර්ථවාදීව, හේතුවාදීව අප ඉදිරියේ තිබෙන්නාවූ ප්‍රශ්න වලට මුහුණ දෙන්නේ කවදාද, එදිනට අපට අපගේ අභියෝග සාර්ථකව විසඳාගැනීමට හැකි වනු නියතය.

බෙදුම්වාදයට මුහුණ දිය හැක්කේ ද එලෙසටය. එසේ නොවන කළ සමාජයක් ලෙස විනාශ මුඛයට ඇදවැටීම අපට වලක්වා ගත නොහැකි බව, අප රටතුළින්ම මෙන්ම විදේශයන් ගෙන්ද උගත හැකි අත්දැකීම් බොහෝය. ඉන් එක් උදාහරණයක් අපට සපයන්නේ දෙවන ලෝක යුද්ධ සමයේ පැවැති ජර්මනියයි. ඒ නිසාම ජර්මනිය විනාශ වීම වලක්වා ගැනීමට උත්සාහ දැරූ පුද්ගලයකුගේ සුප්‍රසිද්ධ කියමනකින් මේ ලිපිය අවසන් කරමි. ඒ අන් කිසිවක් නිසා නොව ඇති කරගත යුතු එළැඹි සිහිය අප තුළ ඇති කරගනු පිණිසය.

"එදා ජර්මනියේ නාසිවාදීන් පළමුව ඝාතනය කරනු ලැබූවාහු කොමියුනිස්ට්වරුන්ය.
ඉන් පසු ඒ ගැන කිසිවක් නොකිමි. - මා කොමියුනිස්ට් වාදියකු නොවූ නිසාය.
ඉන්පසු ඔවුන්ගේ ඉලක්කය වූයේ යුදෙව්වන්ය.
මා බසක්වත් නොකීවේ මා යුදෙව්වකු නොවන නිසාය.
ඊළඟට ඔවුන් වෘත්තීය සමිති ක්‍රියාකාරිකයන් මරා දැමූහ.
මා නිකන් බලා සිටියෙමි. මන්ද මා වෘත්තීය සමිතියකට බැඳී නැත.
ඔවුහු යලිත් කතෝලිකයන් ඝාතනය කළහ.
මා කුමක් කියන්න ද? මා ප්‍රොතෙස්තන්ත ආගමිකයෙකි.

අන්තිමේදී ඔවුන් පැමිණියේ මා වෙතය.
සැබෙවින්ම එවිට මා වෙනුවෙන් යුක්තිය කථා කිරීමට කිසිවකු නොසිටියේය."

මාටින් සිවොලර්

------ දියසේන විසිනි -----11 01 2007